# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 20135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


SEC 2016/01

2016.01.20

**බැංකු, මූල්‍යායතන සහ මෝටර් වාහන ආනයනකරුවන් වෙත නිකුත් කෙරෙන චක්‍රලේඛය**
**2016 අයවැය මගින් යෝජිත වාහන හිමිකම් ගාස්තුව පැනවීම**

මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා, 2015 අංක 10 දරන මුදල් පනත යටතේ පනවනු ලැබූ මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව වෙනුවට, මුදල් පනතට සිදු කරනු ලබන සංශෝධනවලට යටත්ව, 2016.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි වාහන හිමිකම් ගාස්තුව හඳුන්වා දෙනු ලැබේ.

වාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරනු ලබන අවස්ථාවේ දී අදාළ බැංකු මගින් වාහන ආනයනකරුවන්ගෙන් මෙම ගාස්තුව, පහත වගුවෙහි දැක්වෙන පරිදි අය කරනු ලැබිය යුතුය.

| අනුප්‍රමාණය | වාහන වර්ගය | සංයෝජිත වර්ගීකරණ වාහන අංක |
|---|---|---|
| වාහනයක් සඳහා රු.2,000/- | මෝටර් සයිකල්<br>ත්‍රීරෝද රථ<br>ට්‍රැක්ටර් | • 87.03.21.51, 87.03.21.52, 87.03.21.53, 87.03.21.54, 87.03.21.55, 87.03.31.50, 87.03.31.60, 87.03.90.11, 87.03.90.12<br>• 87.04.21.21, 87.04.21.22, 87.04.31.21, 87.04.31.22, 87.04.31.23, 87.04.90.10, 87.04.90.20.<br>• රේගු කාර්යය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.01 යටතේ වන සියළුම වාහන<br>• රේගු කාර්යය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.11 යටතේ වන සියළුම වාහන |
| වාහනයක් සඳහා රු.15,000/- | මෝටර් කාර් | • 87.04.21.71, 87.04.21.72, 87.04.21.91, 87.04.21.92, 87.04.21.93, 87.04.21.99, 87.04.31.71, 87.04.31.72, 87.04.31.91, 87.04.31.92, 87.04.31.93, 87.04.31.99<br>• රේගු කාර්යය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.02 යටතේ වන සියළුම වාහන<br>• රු. 2000/- අනුප්‍රමාණයට අයත් වාහන කාණ්ඩ හැර රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.03 යටතේ වන සියළුම වාහන. |

| | | |
|---|---|---|
| වාහනයක් සඳහා රු.10,000/- | අනෙකුත් සියළු වාහන | • පරිච්ඡේද 87.05 සහ 87.13 හි ඇතුළත් රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ වන වාහන හැර පරිච්ඡේද 87 යටතේ වර්ගීකරණය කරන ලද ඕනෑම වාහනයක් |

වාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරනු ලබන අවස්ථාවේ දී වාහන හිමිකම් ගාස්තුව එකතු කරනු ලබන සියළුම බැංකු හා මූල්‍යායතන විසින්, අමුණා ඇති ආකෘතියේ දැක්වෙන පරිදි වාර්තා පවත්වා ගත යුතුය.

මෙසේ අයකර ගනු ලැබූ ගාස්තුව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නමින් මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 014100129027740 දරණ ගිණුමට බැර කරන ලෙස දැක්වූ චෙක්පතක් හෝ බැංකු අණකරයක්, නියමිත පරිදි සම්පූර්ණ කරනු ලැබූ උපලේඛන දෙකක් සමඟ පහත දක්වා ඇති පරිදි කොළඹ 2, නවම් මාවතේ පිහිටි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රඳවා ගැනීමේ බදු අංශයේ කොමසාරිස්වරයා වෙත භාරදිය යුතුය.

1. යම් මාසයක 1 වන දිනයේ සිට 15 වන දිනය දක්වා වූ කාලය සඳහා එම මාසය අවසානයේ දී හෝ ඊට පෙර,

2. එම මාසයේ 16 වන දින සිට එම මාසයේ අවසානය දක්වා වූ කාලසීමාව සඳහා, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර,

කළ්‍යාණි දහනායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

කල්‍යාණි දහනායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

**2016 අයවැය මගින් යෝජිත පරිදි, මුදල් පනත යටතේ මෝටර් වාහන ආනයනකරුවන්ගෙන් වාහන හිමිකම් ගාස්තුව එකතු කිරීම**

**බැංකුවේ නම:**

**ලිපිනය:**

**බ.ගෙ.හැ. අංකය:**

**කාලසීමාව : මාසයේ පළමු භාගය/දෙවන භාගය** **මාසය:** **වර්ෂය:**

| අනු අංකය | ආනයනකරුගේ විස්තර | | | | ණයවර විවෘත කරන ලද වාහන සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | නම | ලිපිනය | ආදායම් බදු ලිපිගොනු අංකය/බ.ගෙ.හැ. අංකය | ණයවර අංකය | මෝටර් සයිකල්/ ත්‍රිරෝද රථ/ ට්‍රැක්ටර් (2000/-) | මෝටර් කාර් (15,000/-) | අනෙකුත් සියළුම වාහන (10,000/-) | එකතු කරන ලද මුළු වාහන හිමිකම් ගාස්තුව |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | **එකතුව** | | | | |

**ප්‍රේෂණ තොරතුරු**

| **චෙක්පත් අංකය / අණකර අංකය** | **ප්‍රේෂණය කරන ලද දිනය** | **ප්‍රේෂණය කරන ලද මුදල** |
|---|---|---|
| | | |

**ප්‍රකාශනය**

මගේ දැනුම හා විශ්වාසය අනුව මෙම උපලේඛනයේ සඳහන් සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

ප්‍රකාශ කරන්නාගේ නම:

තනතුර:

දුරකථන අංකය:

ප්‍රකාශ කරන්නාගේ අත්සන:

දිනය: